# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2147/49 - 2019 ඔක්තෝබර් මස 30 වැනි බදාදා - 2019.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

### සුරාබදු නිවේදනය

**ස්ටිකර සහ ස්ටිකර කළමනාකරණ පද්ධතිය**

(52 වන අධිකාරිය වන) සුරාබදු ආඥාපනතේ 8 වන සහ 30 වන වගන්ති සමග කියවිය යුතු 32 වන වගන්තිය යටතේ මුදල් විෂයභාර අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, සුරාබදු ආඥාපනත යටතේ පනවන ලද 2019 සුරාබදු (ආරක්ෂිත සලකුණු) රීති යනුවෙන් හඳුන්වනු ලබන, අංක 2128/30 දරන 2019.06.20 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 04/2019 දරන සුරාබදු නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද එම *ගැසට් පත්‍රයේ* II වන උපලේඛනයේ සඳහන් ආනයනකරුවකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු සඳහා මෙම රීති අදාළ වන අතර එය 2019 ඔක්තෝබර් මස 23 වන දින පාර්ලිමේන්තුවේ දී සම්මත වූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ආර්. දේශප්‍රිය,<br>
ලේකම් *(වැඩබලන)*<br>
මුදල් අමාත්‍යාංශය.

2019 ඔක්තෝබර් මස 30 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1A - PG 4560 — 592 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*